# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1890/14 - 2014 නොවැම්බර් මස 26 වැනි බදාදා - 2014.11.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### නිවේදනය

ජනා.කා.අංකය : සීඑස්ජී/1/3/1/1.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(1)(ආ) ව්‍යවස්ථාව යටතේ බලතල ක්‍රියාත්මක කරමින් අතිගරු ජනාධිපතිතුමා විසින් තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය ධුරයට පත්කරනු ලැබූ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී පාඨලී චම්පික රණවක මැතිතුමා 2014 නොවැම්බර් මස 18 වැනි දින සිට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 47(ආ) ව්‍යවස්ථාව යටතේ එම අමාත්‍ය ධුරයෙන් ඉල්ලා අස්වී ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

ලලිත් වීරතුංග,
ජනාධිපති ලේකම්.

2014 නොවැම්බර් මස 24 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

12 - 377/1

---

### නිවේදනය

ජනා.කා.අංකය : සීඑස්ජී/1/3/1/2.

අතිගරු ජනාධිපතිතුමා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 47(අ) ව්‍යවස්ථාව යටතේ එතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2014 නොවැම්බර් මස 21 වැනි දින සිට පහත සඳහන් අමාත්‍යවරුන් එම අමාත්‍ය ධුරවලින් ඉවත් කරනු ලැබූ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. ගරු පල්ලේවත්තේ ගමරාලලාගේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා - පා. ම. - සෞඛ්‍ය අමාත්‍ය
2. ගරු රාජිත සේනාරත්න මැතිතුමා - පා. ම. - ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය
3. ගරු දුමින්ද දිසානායක මැතිතුමා - පා. ම. - අධ්‍යාපන සේවා අමාත්‍ය

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

ලලිත් වීරතුංග,
ජනාධිපති ලේකම්.

2014 නොවැම්බර් මස 24 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

12 - 377/2


1A - G 20659 — 05 (2014/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## නිවේදනය

ජනා.කා.අංකය : සීඑස්ඒ/1/3/1/2.

අතිගරු ජනාධිපතිතුමා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 47(අ) ව්‍යවස්ථාව යටතේ එතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2014 නොවැම්බර් මස 21 වැනි දින සිට පහත සඳහන් නියෝජ්‍ය අමාත්‍යවරයා එම නියෝජ්‍ය අමාත්‍ය ධුරයෙන් ඉවත් කරනු ලැබූ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. ගරු එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන මැතිතුමා - පා. ම. - බුද්ධ ශාසන හා ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍ය

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

ලලිත් වීරතුංග,
ජනාධිපති ලේකම්.

2014 නොවැම්බර් මස 24 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

12 - 377/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.